# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරු සිසු අත්වැල

**(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)**

## Economics

නිපුණතාවය 03

3.1. වෙළඳපොළට රජය මැදිහත් වන ආකාරය විග්‍රහ කරයි

---

# වෙළඳපොළට රජය මැදිහත්වීම


**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**

**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**

**සම්පත් දායකත්වය :**G .K **නිරෝෂා දීපානි**

**ර / මැද්දෙකන්ද ම වි**


**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

## පාඩමට පිවිසීම

**පහත සිදුවීම් පිළිබඳ ඔබේ අදහස දක්වන්න**

- ගොවීන්ට ලබාදෙන පොහොර සහනාධාරය

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

- මත් ද්‍රව්‍ය සඳහා දැඩි නීති හා දඩ නියමකිරීම

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

- සහල් සඳහා රු 65 ක අවම මිලක් නියම කිරීම

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

- වී කිලෝවක සහතික මිල  රු 45 ක් ලෙස නියම කිරීම

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

**නිපුණතාවය3 :**

**වෙළඳපොළට රජය මැදිහත් වන ආකාරය**

# අන්තර්ගතය

- බදු පැනවීම
- සහනාධාර ලබාදීම
- මිල පාලනය
- මිල ස්ථායීකරණය

# 3.1. වෙළඳපොළට රජය මැදිහත් වන ආකාරය විග්‍රහ කරයි

## වෙළඳපොළට රජය මැදිහත් වන ආකාරය

- ඉල්ලුම් සැපයුම් බලවේග මගින් තීරණය වන වෙළෙඳපොළ සමතුලිත මගින් සමාජයක් තුළ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ සහ බෙදාහැරීමේහිලා කිසියම් ආකාරයක වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

- එසේ වුවද සමාජයීය, දේශපාලන හා ආර්ථික දෘෂ්ටිකෝණවලින් බලා මෙම වෙළඳපොළ සමතුලිතය සමාජයට අහිතකර වේ යැයි යන විවිධ මත පළ කෙරේ.

- මේ නිසා නිදහස් වෙළඳපොල ක්‍රියාකාරීත්වයට විවිධ ස්රූපවලින් රජය මැදිහත් වනු දක්නට ලැබේ.

- මෙලෙස වෙළඳපොලට රජය මැදිහත් වන ආකාර .
  - බදු පැනවීම
  - සහනාධාර ලබාදීම
  - මිල පාලනය
  - මිල ස්ථායීකරණය

- වෙළඳපොළ ක්‍රියාකාරිත්වයට ආණ්ඩුව මැදිහත් වන සුලබම ආකාරයක් වන්නේ නිෂ්පාදකයන්ගෙන් හා පාරිභෝගිකයන්ගෙන් බදු අය කිරිමයි.

- විවිධ අරමුණු ඇතිව ආණ්ඩුව බදු අය කිරීම සිදුකරන අතර නිෂ්පාදනය හා පරිභෝජනය කරනු ලබන ඒකකයන් මත නිශ්චිත රුපියල් ප්‍රමාණයක බදු අය කිරීම හෝ භාණ්ඩයේ වටිනාකම මත කිසියම් ප්‍රතිශතයක් බදු වශයෙන් අය කිරීම හෝ ලෙසින් බදු අය කිරීමේ ස්වරූප දෙකක් දැකිය.

- මෙලෙසින් බදු අය කිරීම නිසා ඉල්ලුම් සැපයුම් තත්ත්වය වෙනස් වන බැවින් ඉල්ලුම් සැපයුම් බලවේග මගින් තීරණය වන වෙළෙඳපොළ සමතුලිතයෙහි වෙනස්කම් හටගනී.

- බදු අය කරන්නා සේම රජය නිෂ්පාදකයන්ට හා පාරිභෝගිකයන්ට සහනාධාර දීමද සිදු කරයි.

- සහනාධාර දීම නිසා ද ඉල්ලුම් සැපයුම් තත්ත්වය වෙනස් වන බැවින් ඉල්ලුම් සැපයුම් බලවේග මගින් තීරණය වන වෙළෙඳපොළ සමතුලිතයෙහි වෙනස්කම් හටගනී.

- බදු අය කිරීම හා සහනාධාර ලබාදීම හැරුණු විට රජය මිල ප්‍රතිපත්ති මගින් ද ඉල්ලුම් සැපයුම් බලවේග මගින් තීරණය වු සමතුලිත අගයන් වෙනස් කරන අවස්ථාද පවතී.

- මිල ප්‍රතිපත්ති යටතේ පාලනය කරන ලද මිල ගනන් හඳුන්වාදීම වර්තමානයෙහි විවිධ ආණ්ඩු විසින් අනුගමනය කරනු ලබන සුලභ ක්‍රියාමාර්ගයකි.

- එහිදී ආණ්ඩුව නීති මගින් මිල නියම කිරීමේ කාර්යයට අවතීර්ණ වීමත් සිදු කරන අතර ඒ නිසා වෙළඳපොළ යාන්ත්‍රණය ක්‍රියාකාරීත්වය නිෂ්ක්‍රීය වීමක් සිදු වේ.

- නීතී මගින් ආණ්ඩුව නියම කරනු ලබන මෙවැනි මිල ප්‍රතිපත්ති ස්වරූප දෙකකි.

1. උපරිම මිල සීමා නියම කිරීම
2. අවම මිල සීමා නියම කිරීම

- නිෂ්පාදිත භාණ්ඩවල මිල ගනන් නිරන්තරයෙන් උච්ඡාවචනය වන විට ආර්ථිකය තුළ මිල අස්ථායිතාවයක් හටගනී. එවැනි මිල අස්ථායිතාව අරමුණු කරගෙන ආණ්ඩු විසින් විවිධ මිල ස්ථායීකරණ ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## 3.2. භාණ්ඩ හා සේවා මත බදු පැනවීම

**<u>බදු පැනවීම</u>**

රජයක් පුද්ගලයන්ගේ ආදායම මත හෝ භාණ්ඩ හා සේවා මත බදු පනවයි.

මෙම පරිච්ඡේදයේදී භාණ්ඩ හා සේවා මත පනවන බදු පිළිබඳ අධ්‍යයනය කරයි.

- **බදු පැනවිය හැකි පාර්ශව**

බදු පැනවිය හැකි පාර්ශව 02 කි.

01. විකුණුම්කරුවන් මත බදු පැනවීම

එවිට සැපයුමට බලපායි

02. ගැනුම්කරුවා මත බදු පැනවීම

එවිට ඉල්ලුමට බලපායි

## ➢ බදු පැනවිය හැකි ස්වරූප

මෙසේ විකුණුම්කරුවන් සහ ගැනුම්කරුවන් මත බදු පැනවිය හැකි ස්වරූප 02 කි.

**01. ඒකක බද්ද / විශේෂිත අය බද්ද**

නිෂ්පාදනය කරනු ලබන සෑම භාණ්ඩ ඒකකයක් මත නිශ්චිත රුපියල් ප්‍රමාණයක බද්දක් අය කිරීම මෙයින් අදහස් වේ.

උදා පෙට්‍රල්,ඩීසල්, මත්පැන් ආදී මත අයකරන බදු

**02. වටිනාකම් මත බද්ද / ප්‍රතිශතක බද්ද**

අලෙවි වන භාණ්ඩ හා සේවා වල වටිනාකම් පදනම් කරගෙන කිසියම් වූ බදු ප්‍රතිශතයක් අයකිරීම මේ නමින් හැඳින්වේ.

උදා ආනයන තීරු බදු, VAT

### ❖ විකුණුම්කරුවන් මත ඒකක බද්දක් පැනවීම

විකුණුම්කරුවන් මත පනවනු ලබන ඒකක බද්ද නිසා සැපයුම ( සැපයුම් වක්‍රය, ලේඛනය, සමීකරණය) වෙනස් වේ. ඒකක බද්ද නිසා නිෂ්පාදන පිරිවැය අනිවාර්යෙන්ම ඉහළ යන අතර එහි ප්‍රතිඵල වශයෙන් සැපයුම අඩු වීමක් සිදුවේ.

මෙහිදී ඒකක බද්ද නිසා සැපයුම අඩුවීම පහත ආකාර 03 යටතේ හඳුනාගත හැකිය.

1. සැපයුම් ලේඛනයක් වෙනස් වීම
2. සැපයුම් වක්‍රය වෙනස් වීම
3. සැපයුම් සමීකරණය වෙනස් වීම

### 01. ඒකක බද්දක් නිසා සැපයුම් ලේඛනය වෙනස් වීම

උදා- x භාණ්ඩයේ සැපයුම් ලේඛනය පහත දැක්වේ. ඒ අනුව රජය විසින් රුපියල් 10 ක බද්දක් පැනවූයේ නම්

බද්දෙන් පසු මිල වෙනස් වන ආකාරය


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මිල (රු) | 10 | 20 | 30 | 40 | 50 | 60 |
| සැපයුම් ප්‍රමාණය (ඒකක මිලියන) | 50 | 100 | 150 | 200 | 250 | 300 |
| නව මිල (රු) (බද්දට පසු) | 20 | 30 | 40 | 50 | 60 | 70 |

බද්දෙන් පසු සැපයුම් ප්‍රමාණය  වෙනස් වන ආකාරය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මිල (රු) | 10 | 20 | 30 | 40 | 50 | 60 |
| සැපයුම් ප්‍රමාණය (ඒකක මිලියන) | 50 | 100 | 150 | 200 | 250 | 300 |
| නව සැපයුම් ප්‍රමාණය (බද්දට පසු) | 0 | 50 | 100 | 150 | 200 | 250 |

**02ඒකක බද්දක් නිසා සැපයුම් වක්‍රය වෙනස් වීම**

ඉහත දක්වන ලද එක නිදසුනෙහි දත්ත ආශ්‍රයෙන් බද්දට පෙර හා පසු සැපයුම් වක්‍ර මෙසේ නිර්මාණය කළ හැක.




ඒකක බද්ද නිසා සැපයුම් වක්‍රය බද්දේ ප්‍රමාණයෙන් වමට විතැන් වේ.

**03. ඒකක බද්දක් නිසා සැපයුම් සමීකරණය වෙනස් වීම**

නිදසුන

x භාණ්ඩයේ සැපයුම් සමීකරණය Qs = 500+5Ps වේ. එම භාණ්ඩයට රුපියල් 10ක ඒකක බද්දක් පැනවූයේ නම් නව සැපයුම් සමීකරණය පහත දැක්වෙන ආකාරයට ගණනය කළ හැකි වේ

$$Qs = 500+5Pb$$
$$= 500+5(pb-t)$$
$$= 500+5(pb-10)$$
$$= 500+5pb-50$$
$$Qs = 450+5pb$$

## ➢ බදු ආපාතය හෙවත් බදු බර බෙදීයාම


රජයේ විසින් පැණවූ බද්දක් අවසාන වශයෙන් දරන්නේ කවුරුන්ද යන්න බදු ආපාතය නම් වේ.

බද්දක් නීතිමය වශයෙන් නිෂ්පාදකයන් මත පැන වුවද ඔවුන්ට සැබෑ බදු බර අන්‍යයන් වෙත පැවරීමට හැකි වේ. එවිට බදු බර නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් අතර බෙදී යයි. එසේ සැබෑ බදු බර බෙදී යන ආකාරය තීරණය වන්නේ ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවය අනුවය.


### • සම්පූර්ණ බදු බර පාරිභෝගිකයන් විසින් දැරීම

<u>සම්පූර්ණ බදු බර පාරිභෝගිකයා</u> දරන්නේ බද්දේ ප්‍රමාණයෙන්ම භාණ්ඩයේ මිල ඉහළ යන අවස්ථාවලදී ය. එවැනි අවස්ථා 02 කි.

01. පූර්ණ අනම්‍ය ඉල්ලුම





02. පූර්ණ නම්‍ය සැපයුම





### • සම්පූර්ණ බදුබර නිශ්පාදකයා විසින් දැරීම

බද්ද හේතුවෙන් වෙළෙඳපොළ මිලේ කිසිදු වෙනසක් සිදු නොවන අවස්ථාවකදී සම්පූර්ණ බදු බර නිශ්පාදකයා විසින් දරනු ලැබේ. එවැනි අවස්ථා 02 කි.

01. පූර්ණ අනම්‍ය සැපයුම





02. පූර්ණ නම්‍ය ඉල්ලුම




- **නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා සමානව බදුබර දැරීම**

නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා සමානව බදු බර දරන්නේ බද්දෙන් හරි අඩකින් මිල ඉහල යන්නේ නම්ය. එවැනි අවස්ථා 02 ක් මෙසේ දැක්විය හැකිය.

01. ඒකීය නම්‍ය ඉල්ලුම කදී හා ඒකිය නම්‍ය සැපයුමක දී




02. ඉල්ලුම් නම්‍යතාව හා සැපයුම් නම්‍යතාවය යන දෙකම 0.5 ක් වීම





- **බද්දෙන් වැඩි කොටසක් පාරිභෝගිකයා විසින් දැරීම**

සැපයුම් නම්‍යතාවයට සාපේක්ෂව ඉල්ලුම් නම්‍යතාව අඩු අගයක් ගන්නා සෑම අවස්ථාවකදීම වැඩි බදුබරක් පාරිභෝගිකයා විසින් දරයි.

එවැනි අවස්ථා අනන්ත සංඛ්‍යාවක් ඇත.

| **ඉල්ලුම් නම්‍යතාව** | **සැපයුම් නම්‍යතාව** |
|---|---|
| අනම්‍ය 0.5 | නම්‍ය 1.5 |
| අනම්‍ය 0.2 | අනම්‍ය 0.6 |
| නම්‍ය 1.5 | නම්‍ය 2 |
| ඒකීය 1 | නම්‍ය 1.8 |
| අනම්‍ය 0.5 | ඒකීය 1 |


අනම්‍ය ඉල්ලුමකදී හා නම්‍ය සැපයුමකදී



- **බද්දෙන් වැඩි කොටසක් නිශ්පාදකයා විසින් දැරීම**

ඉල්ලුම් නම්‍යතාවයට සාපේක්ෂව සැපයුම් නම්‍යතාව අඩු අගයක් ගන්නා සෑම අවස්ථාවකදීම වැඩි බදු බරක් නිෂ්පාදකයා විසින් දරයි. එවැනි අවස්ථා අනන්ත සංඛ්‍යාවක් ඇත.

| සැපයුම් නම්‍යතාවය | ඉල්ලුම් නම්‍යතාවය |
|---|---|
| අනම්‍ය 0.5 | නම්‍ය 1.5 |
| අනම්‍ය 0.2 | අනම්‍ය 0.6 |
| නම්‍ය 1.5 | නම්‍ය 2 |
| ඒකීය 1 | නම්‍ය 1.8 |
| නම්‍ය 0.5 | ඒකීය 1 |




නිදසුන ;

තරගකාරි වෙළඳපලක අලෙවි වන x භාණ්ඩයේ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

Qd=1200-30P

Qs=-200+20P

i. බද්දට පෙර සමතුලිත මිල හා ප්‍රමාණය වන්නේ,

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

ii. මෙම අවස්ථාවේදී x භාණ්ඩය මත රජය විසින් රුපියල් 10ක ඒකක බද්දක් පැනවූයේ නම් බද්දෙන් පසු නව සැපයුම් ශ්‍රිතය පහත පරිදි වේ.

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

iii. ඒ අනුව වෙළඳපොළ නව සමතුලිත මිල හා ප්‍රමාණය පහත පරිදි ගණනය කළ හැකිය.

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

iv. ගැනුම් කරුවා දරන බද්ද කොපමණද?

…………………………………………………………………………………………
…………………………………………………………………………………………
…………………………………………………………………………………………


v. විකුණුම්කරුවා දරන බද්ද කොපමණද?

…………………………………………………………………………………………
…………………………………………………………………………………………
…………………………………………………………………………………………

vi. ඉහත දත්ත ප්‍රස්තාර සටහනකින් දක්වමු

## ❖ බදු පැනවීමෙන් ශුභසාධනයට වන බලපෑම


බදු පැනවීම නිසා ආර්ථික අතිරික්තය පෙරට වඩා අඩු වේ. එය අහිමි වන ශුභසාධනය, අධි බදු බර ආදී ලෙස හඳුන්වයි.



| | බද්දට පෙර | බද්දට පසු | වෙනස |
|---|---|---|---|
| පාරිභෝගික අතිරික්තය | A+B+E | A | -(B+E) |
| නිෂ්පාදන අතිරික්තය | C+D+F | D | -(C+F) |
| රජයේ ආදායම | | B+C | B+C |
| සමස්ත ශුභ සාධනය | A+B+C+D+E+F | A+B+C+D | -(E+F) |

## ❖ ගැනුම්කරුවා මත ඒකක බද්දක් පැනවීම

ගැනුම්කරුවන් මත බද්දක් පැනවූ විට ඉල්ලුම අඩුවී ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ. එහෙත් සැපයුම් වක්‍රය වෙනස් නොවේ.




ඒ අනුව බද්ද විකුණුම්කරු මත පැනවූවද ගැනුම්කරු මත පැන වුවද බද්දෙහි ප්‍රතිවිපාක වල වෙනසක් සිදු නොවේ. එහිදී පෙර පරිදිම බදු බර ගැනුම්කරු හා විකුණුම්කරු අතර බෙදී යයි.

01. තරගකාරී වෙළඳපොලකට අදාල ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ

Qd=1000-4p

Qs=-300+4p

i.ඉහත දක්වන ලද තොරතුරු ආශ්‍රයෙන් සමතුලිත මිල හා ප්‍රමාණය ප්‍රස්තාරයකින් දක්වන්න

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

iii. පාරිභෝගික අතිරික්තයේ අගය කොපමණද?

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

iv. නිෂ්පාදන අතිරික්තයේ අගය කොපමණද?

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

…………………………………………………………………………………………

v. ආර්ථික අතිරික්තයේ අගය කොපමණද?

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

vi. මෙම භාණ්ඩයේ අලෙවි වන සෑම ඒකකයක් මතම රු 30 ක අලෙවි බද්දක් පැනවූයේ නම් පහත අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

(අ) නව වෙළඳපොළ සැපයුම් වක්‍රය ඉහත ප්‍රස්තාර සටහනේම දක්වා ,බදු පසු සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

(ආ) රජයේ බදු ආදායම කොපමණද?

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

(ඉ) බද්දෙන් පසු පාරිභෝගික, අතිරික්තය, නිෂ්පාදන, ආර්ථික අතිරික්තය කොපමණද?

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

(ඊ) බදු බරින් පාරිභෝගිකයා , නිෂ්පාදකයා දරන කොටස කොපමණද?

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

(උ) බද්ද නිසා ආර්ථිකයට අහිමි වන ශුභසාධනය කොපමණද?

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

02. තරගකාරී වෙළඳපොලකට අදාල ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

Qd=250-2p

Qs=-50+2p

i. ඉහත දක්වන ලද ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත ආශ්‍රයෙන් සමතුලිත මිල හා ප්‍රමාණය ප්‍රස්තාර සටහනක දක්වන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

ii. පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදන අතිරික්තය හා ආර්ථික අතිරික්තය අගය කොපමණද?

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

iii. මෙම භාණ්ඩයේ අලෙවි වන සෑම ඒකකයක් සඳහාම රු. 50 ක බද්දක් පැනවූයේ නම් පහත අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

(අ) නව වෙළඳපොළ සමතුලිත සැපයුම් වක්‍රය ඉහත ප්‍රස්තාර සටහනේම දක්වා , බදු පසු සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

(ආ) රජයේ බදු ආදායම කොපමණද ?

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

(ඉ) බදු බර නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර බෙදී යන ආකාරය දක්වන්න

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

# 3.3. නිෂ්පාදන සහනාධාර ලබාදීම

## <u>නිෂ්පාදන සහනාධාර</u>

නිෂ්පාදන සහනාධාරයක් ලබා දීමක අරමුණ වන්නේ නිෂ්පාදකයන් දිරිගැන්වීම මගින් වැඩි නිෂ්පාදනයක් සඳහා ඔවුන් පෙලඹවීමයි.

නිෂ්පාදන සහනාධාර වල ප්‍රධාන ස්වරූප දෙකකි.

i. ඒකක සහනාධාරය

ii. වටිනාකම් මත සහනාධාරය

### ➢ ඒකක සහනාධාරය

නිෂ්පාදනය කරන සෑම ඒකකයකටම නිශ්චිත රුපියල් ප්‍රමාණයක සහනාධාරයක් ලබා දීම මෙහිදී සිදු වේ. සහනාධාර ලබා දෙන විට නිෂ්පාදන පිරිවැය අඩු වන බැවින් නිෂ්පාදකයන් දිරිමත් වනු ඇත. නිෂ්පාදන සහනාධාරයක් සෘණ බද්දක් ලෙස ද සැලකේ. නිෂ්පාදකයන්ට ඒකක සහනාධාරයක් ලබා දීම නිසා සැපයුම සැපයුම් ලේඛනය සැපයුම් වක්‍රය හා සැපයුම් සමීකරණය වෙනස් වේ. මෙහිදී නිෂ්පාදන පිරිවැය අඩු වන බැවින් එහි ප්‍රතිඵලයක් වශයෙන් සැපයුමේ වැඩිවීමක් සිදුවෙයි. මෙහිදී ඒකක සහනාධාරය නිසා සැපයුම වැඩි වන ආකාර 03 ක් යටතේ හඳුනාගත හැකිය.

01.සැපයුම් ලේඛනය වෙනස් වීම

02.සැපයුම් වක්‍රය වෙනස් වීම

03.සැපයුම් සමීකරණය වෙනස් වීම

### ඒකක සහනාධාරයක් නිසා සැපයුම් ලේඛනය වෙනස් වීම

උදා-; x භාණ්ඩයේ සැපයුම් ලේඛනය පහත දැක්වේ. එහිදී රජය රුපියල් 10 ක ඒකක සහනාධාරයක් සපයන්නේ නම් නව මිල

සහනාධාරයෙන් පසු නව මිල

| මිල (රු) | 10 | 20 | 30 | 40 | 50 | 60 |
|---|---|---|---|---|---|---|
| සැපයුම් ප්‍රමාණය (ඒකක මිලියන) | 50 | 100 | 150 | 200 | 250 | 300 |
| **නව මිල (රු) (සහනාධාරයට පසු)** | **0** | **10** | **20** | **30** | **40** | **50** |


සහනාධාරයෙන් පසු නව සැපයුම් ප්‍රමාණය

| මිල (රු) | 10 | 20 | 30 | 40 | 50 | 60 |
|---|---|---|---|---|---|---|
| සැපයුම් ප්‍රමාණය (ඒකක මිලියන) | 50 | 100 | 150 | 200 | 250 | 300 |
| නව සැපයුම් ප්‍රමාණය | **100** | **150** | **200** | **250** | **300** | **350** |

- **ඒකක සහනාධාරයක් නිසා සැපයුම් වක්‍රය වෙනස් වීම**

ඉහත දැක්වෙන ලද නිදසුන ආශ්‍රයෙන් සහනාධාරයට පෙර හා පසු සැපයුම් වක්‍ර මෙසේ නිර්මාණය කළ හැකිය.

නිෂ්පාදන සහනාධාරයක් හේතුවෙන් සැපයුම් වක්‍රයේ සමාන්තරව සහනාධාරය ප්‍රමාණයම දකුණට විතැන් වේ වක්‍ර දෙක අතර සිරස් දුර ඒකක සහනාධාරයට සමාන වේ.




- **ඒකක සහනාධාරයක් නිසා සැපයුම් සමීකරණය වෙනස්වීම**

නිදසුන i. එක්තරා භාණ්ඩයක් සඳහා වූ සැප සමීකරණය Qs=400+10p වේ. එයට රුපියල් 20ක ඒකක සහනාධාරයක් ගැළපීමෙන් නව සැපයුම් සමීකරණය ලබාගන්න.

$Qs=400+10p$


$=400+10(p+s)$

$=400+10(p+20)$

$=400+10p+200$

$=\underline{\underline{600+10p}}$

## නිෂ්පාදකයන් මත ඒක ක සහනාධාරයක් ලබා දීම සමතුලිතය කෙරෙහි බලපාන ආකාරය




- සමතුලිත මිල අඩුවේ
- සමතුලිත ප්‍රමාණය වැඩිවේ

**නිෂ්පාදනය සහනාධාරය හේතුවෙන් වෙළෙඳපොළ සමතුලිතය වෙනස් වන ආකාරය ඉල්ලුම් සැපයුම් සමීකරණ ආශ්‍රයෙන් පහත පරිදි දැක්විය හැකිය.**

උදා- A භාණ්ඩයේ සඳහා පවතින වෙළඳපොල ඉල්ලුම හා සැපයුම් සමීකරණ පහත පරිදි ඉදිරිපත් කර ඇත.

Qd=400-4p

Qs=-300+6p

i. සහනාධාරයට පෙර සමතුලිත මිල හා ප්‍රමාණය වන්නේ,

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

ii. මෙම අවස්ථාවේදී A භාණ්ඩය මත රුපියල් 10ක ඒකක සහනාධාරයක් රජය විසින් පනවනු ලැබේ නම් A භාණ්ඩයේ නව සැපයුම් ශ්‍රිතය ගොඩනගන්න.

.......................................................................................

.......................................................................................

.......................................................................................

.......................................................................................

.......................................................................................

.......................................................................................

.......................................................................................

(අ) ඒ අනුව නව වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

.......................................................................................

.......................................................................................

.......................................................................................

.......................................................................................

.......................................................................................

.......................................................................................

.......................................................................................

## ❖ සහනාධාරයේ වාසිය දැරීම

සහනාධාරය වාසිය බෙදී යන ආකාරය ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවයන් මත තීරණය වේ. පාරිභෝගිකයාට සහ නිෂ්පාදකයාට හිමිවන වාසිය පහත සඳහන් ආකාරයට ගණනය කළ හැකිය. (විශේෂයෙන් ඒකක යනුවෙන් අසා නොමැති විට අසා ඇත්තේ මුළු වාසිය බව සලකන්න).

| |
|---|
| පාරිභෝගිකයාගේ මුළු වාසිය=(පැරණි සමතුලිත මිල--නව සමතුලිත මිල)×නව සමතුලිත ප්‍රමාණය |


| |
|---|
| නිෂ්පාදකයාගේ මුළු වාසිය=(ඒකක සහනාධාරය-පාරිභෝගිකයාගේ කොටස)×නව සමතුලිත ප්‍රමාණය |

නිෂ්පාදකයාගේ මුළු වාසිය=(නිෂ්පාදකයාට ලැබෙන -පැරණි සමතුලිත මිල)-නව
ශුද්ධ මිල සමතුලිත
ප්‍රමාණය


## සහනාධාරයේ සම්පූර්ණ වාසියම පාරිභෝගිකයා විසින් භුක්ති විඳීම

සහනාධාරය ප්‍රමාණයම භාණ්ඩයේ මිල පහල යන්නේ නම් එවැනි අවස්ථාවලදී සහනාධාරයේ වාසිය සම්පූර්ණයෙන්ම පාරිභෝගිකයා සතුවේ. එවැනි අවස්ථා 02කි.

i. පූර්ණ අනම්‍ය ඉල්ලුම





ii. පූර්ණ නම්‍ය සැපයුම





## ➢ සහනාධාරයේ සම්පූර්ණ වාසියම නිශ්පාදකයා විසින් භුක්ති විඳීම

සහනාධාරය හේතුවෙන් වෙළඳපොල මිලෙහි කිසිදු වෙනසක් සිදු නොවන අවස්ථාවකදී සහනාධාරයේ වාසිය සම්පූර්ණයෙන්ම නිශ්පාදකයා සතුවේ. එවැනි අවස්ථා 02කි.

i. පූර්ණ අනම්‍ය සැපයුම





ii. පූර්ණ නම්‍ය ඉල්ලුම




## ➢ නිෂ්පාදකයා හා පාරිභෝගිකයා සහනාධාරය සමානව බුක්ති විඳීම

නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා සමානව සහනාධාරයේ වාසිය දරන්නේ සහනාධාරයේ හරි අඩකින් මිල පහල යන්නේ නම්ය. එවැනි අවස්ථා 02 ක් මෙසේ දැක්විය හැකිය

i.ඒකීය නම්‍ය ඉල්ලුම හා ඒකීය නම්‍ය සැපයුම




ii.ඉල්ලුම් නම්‍යතාව හා සැපයුම් නම්‍යතාවය යන දෙකම 1.5ක් විය





## ➢ සහනාධාරයෙන් වැඩි කොටසක් පාරිභෝගිකයා බුක්ති විඳීම

සැපයුම් නම්‍යතාවයට සාපේක්ෂව ඉල්ලුම් නම්‍යතාව අඩු අගයක් ගන්නා සෑම අවස්ථාවකදීම සහනාධාරයෙන් වැඩි වාසියක් පාරිභෝගිකයා විසින් දරයි.

එවැනි අවස්ථා අනන්ත සංඛ්‍යාවක් ඇත

| ඉල්ලුම් නම්‍යතාව | සැපයුම් නම්‍යතාව |
|---|---|
| අනම්‍ය 0.6 | නම්‍ය 1.6 |
| අනම්‍ය 0.2 | අනම්‍ය 0.5 |
| නම්‍ය 1.5 | නම්‍ය 2 |
| ඒකීය 1 | නම්‍ය 3 |
| අනම්‍ය 0.3 | ඒකීය 1 |




## ➢ සහනාධාරයෙන් වැඩි කොටසක් නිශ්පාදකයා බුක්ති විඳීම

ඉල්ලුම් නම්‍යතාවට සාපේක්ෂව සැපයුම් නම්‍යතාව අඩු අගයක් ගන්නා සෑම අවස්ථාවකදීම සහනාධාරයෙන් වැඩි වාසියක් නිශ්පාදකයා විසින් දරයි.

එවැනි අවස්ථා අනන්ත සංඛ්‍යාවක් ඇත.


| **සැපයුම් නම්‍යතාව** | **ඉල්ලුම් නම්‍යතාවය** |
|---|---|
| අනම්‍ය 0.6 | නම්‍ය 1.6 |
| අනම්‍ය 0.2 | අනම්‍ය 0.5 |
| නම්‍ය 1.5 | නම්‍ය 2 |
| ඒකීය 1 | නම්‍ය 3 |
| නම්‍ය 0.3 | ඒකීය 1 |

අනම්‍ය සැපයුමේදී නම්‍ය ඉල්ලුම




0

## සහනාධාරය ලබා දීමෙන් ආර්ථික සුබසාධනයට වන බලපෑම



| | සහනාධාරයට පෙර | සහනාධාරයට පසු | වෙනස |
|---|---|---|---|
| පාරිභෝගික අතිරික්ත | A+B | A+B+C+G+H | C+G+H |
| නිෂ්පාදන අතිරික්තය | D+C | B+C+D+E | B+E |
| සහනාධාරය සඳහා රාජ්‍ය වියදම | | B+C+E+F+G+H | B+C+E+F+G+H |
| ආර්ථික අතිරික්තය | A+B+C+D | A+D+B+C+F | H+G+B+C+E |

01. තරඟකාරී වෙළඳපොලක අලෙවි වන එක්තරා භාණ්ඩයක ඉල්ලුම් සැපයුම් ශ්‍රිත පහත දැක්වේ

Qd=1000-40p

Qs=-600+40p

i. සමතුලිත මිල හා ප්‍රමාණය පස්තාර සටහනකින් දක්වන්න

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

ii. මෙම භාණ්ඩය ඒකකයක් සඳහා රුපියල් 10 බැගින් වූ සහනාධාරයක් ලබා දුන්නේ නම් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අ) සහනාධාරයෙන් පසු සමතුලිත මිල හා ප්‍රමාණය

………………………………………………………………………………………
………………………………………………………………………………………
………………………………………………………………………………………
………………………………………………………………………………………

ආ) සහනාධාරය සඳහා රජයේ වියදම

.....................................................................................................................

.....................................................................................................................

ඇ) සහනාධාරයෙන් පසු නිෂ්පාදකයාට ලැබෙන ශුද්ධ මිල

.....................................................................................................................

.....................................................................................................................

ඈ) සහනාධාරයෙන් පාරිභෝගිකයා ලබන වාසිය

.....................................................................................................................

.....................................................................................................................

ඉ) සහනාධාරයෙන් නිෂ්පාදකයා ලබන වාසිය

.....................................................................................................................

.....................................................................................................................

උ) සහනාධාරයට පෙර පාරිභෝගික ,නිෂ්පාදන අතිරික්තය

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

එ) සහනාධාරයට පසු පාරිභෝගික ,නිෂ්පාදන අතිරික්තය

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

ඒ) ආර්ථික සුභසාධනයේ අඩුවීම

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

- ✓ **පසු වැඩ**

2007 A/L ප්‍රශ්නය

## 3.4 මිල පාලනය

# මිල පාලනය

වෙළඳපල සමතුලිතය යටතේ තීරණය වන සමතුලිතය සමාජයීය හා දේශපාලනමය වශයෙන් යෝග්‍ය නොවේ යැයි යන විශ්වාසය මත වෙළඳපළ සමතුලිත අගයන් වෙනුවට මිල පාලනය කිරීමට රජය පෙළඹේ.

එහිදී මිල යාන්ත්‍රණයේ ක්‍රියාකාරීත්වය අත්හිටුවා කෘතිම මිලක් යටතේ වෙළඳපොළ හුවමාරුව සිදු කිරීමට උත්සාහ කරයි. මිල පාලනය ප්‍රධාන ආකාර 02 කි.

01. උපරිම මිල පැනවීම

02. අවම මිල පැනවීම

### ❖ උපරිම මිල පැනවීම

රජය විසින් කිසියම් භාණ්ඩයක් විකිණිය යුතු වැඩි මිලක් නීතියෙන් නියම කිරීම උපරිම මිල නම් වේ.


උදා- අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා උපරිම මිලක් නියම කිරීම

උදා -පිටි, සීනි, සහල් ආදිය


ගෙවල් කුලී පාලනය

පොලී අනුපාතික පාලනය

- උපරිම මිල වඩාත් අර්ථවත් වන්නේ එය සමතුලිත මිල වඩා අඩු අවස්ථාවලදී ය. එය සඵල උපරිම මිලක් ලෙස හැඳින්වේ.
- උපරිම මිලක් නියම කළ විට ඊට වඩා අඩු මිලකට භාණ්ඩ විකිණිය හැකි නමුත් ඊට වඩා වැඩි මිලකට භාණ්ඩ විකිණීම නීති විරෝධී වේ.
- වෙළඳපලේ සමතුලිත මිල ඉතා ඉහල මිලක් වන විට එය පහත හෙළීමෙන් පාරිභෝගිකයාට සාධාරණයක් ඉටුකිරීම උපරිම මිල පැනවීමක අරමුණ වේ



- **උපරිම මිල නියම කිරීමක අා්රථික ප්‍රතිවිපාක**




**1. අධි ඉල්ලුමක් බිහිවීම**

ඉල්ලුම් කරන ලබන ප්‍රමාණය සැපයුම් ප්‍රමාණයට වඩා වැඩි බැවින් දිගින් දිගටම වෙළඳපොළ තුළ භාණ්ඩ හිඟයක් (අධි ඉල්ලුමක්) ඇති වේ. මෙහිදී අධි ඉල්ලුම (Q3-Q2 ) වේ.

**2. කළු කඩ තත්වයක් ඇතිවීම.**

කළු කඩයක් යනු නීතිමය සීමාකම් උල්ලංඝනය කරමින් වැඩි මිල ගණන් යටතේ භාණ්ඩ අලෙවි කිරීමයි. උපරිම මිල සීමාවට (0-P2) ඉහළ ඕනෑම මිලක් කළු කඩ මිලක් වේ.

මෙහිදී,

කලු කඩ මිල පරාසය P2-P3 අතර වේ.

උපරිම කලු කඩ මිල P3 වේ.

**3. මිලෙන් සලාක කරන කාර්යය කිරීමට අපොහොසත් වීම.**

**4. නිල නොවන වෙනත් සලාකන මාධ්‍යයන් බිහිවීම.**

- පෝලිම් ක්‍රමය
- සලාක පත් යොදාගැනීම
- අල්ලස් ලබාදීම අල්ලස් ලබාදීම මගින් සලාක කිරීම
- කළු කඩ බිහිවීම
- වෙනත් භාණ්ඩ සමඟ සම්බන්ධ කොට බෙදා හැරීම

**5. එම භාණ්ඩය සඳහා කරන ආයෝජනය අඩුවීම.**

මිල පාලනය නිසා (මිල අඩු වීමෙන්) ලාභය සීමා වන බැවින් එම නිෂ්පාදන ක්‍රමාන්ත වල කරනු ලබන ආයෝජන අඩු වීම.

**6. අධි ඉල්ලුම ඉවත් කිරීමට රජයට මැදිහත් වීමට සිදු වීම.**


- සලාක ක්‍රමයක් හඳුන්වාදීම
- හිඟය ආනයනය
- දේශීය නිෂ්පාදකයන් ධෛර්යමත් කිරීම

**7. ශුභ සාධනය පහත වැටීම**

## අහිමිවන සුභසාධනය (සුබසාධන පිරිවැය/පරිවාරක පිරිවැය/පුහු පිරිවැය)

රජය වෙළඳපොළට මැදිහත් වන නිසා ආර්ථික අතිරික්තයේ සිදුවන අඩුවීම අහිමිවන ශුභසාධනය යි.

## උපරිම මිල ප්‍රතිපත්තිය සුබසාධන ප්‍රතිවිපාකය



| | උපරිම මිලට පෙර | උපරිම මිලට පසු | වෙනස |
|---|---|---|---|
| පාරිභෝගික අතිරික්තය | A+B+E | A+B+C | E+C |
| නිෂ්පාදන අතිරික්තය | C+D+F | D | -(C+F) |
| සමස්ත සුභසාධනය | A+B+E+C+D+F | A+B+C+D | -(E+F) |

අහිමිවන සුභසාධනය E+F වේ.

01. එක්තරා භාණ්ඩයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 10 | 500 | 100 |
| 20 | 100 | 500 |

i. ප්‍රස්ථාරයක ඉල්ලුම් හා සැපයුම් වක්‍ර අඳින්න.

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

ii. සමතුලිත මිල හා ප්‍රමාණය කොපමණද?

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

iii. පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදන අතිරික්තය, ආර්ථික අතිරික්තය කොපමනද?

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................

iv. රජය මෙම භාණ්ඩයේ උපරිම මිල රු.10 ක් ලෙස නියම කරයි නම් ඇතිවන අධි ඉල්ලුම කොපමණ ද?

..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................

I . කළු කඩයෙහි අය කල හැකි උපරිම මිල කවරේද ?

..............................................................................................
..............................................................................................

ii. උපරිම මිලෙන් පසු පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදන අතිරික්තය, ආර්ථික අතිරික්තය කොපමනද?

..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................

iii අහිමි වන සුභසාධනය දක්වන්න

..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................


## ❖ අවම මිල පැනවීම

- රජයේ විසින් කිසියම් භාණ්ඩයක් විකිණිය යුතු අඩුම මිලක් නීතියෙන් නියම කිරීම අවම මිලපැනවීමයි.
- වෙළඳපොලේ සමතුලිත මිල ඉතා පහළ මිලක් වන විට එය ඉහළ දැමීමෙන් නිෂ්පාදකයාට ප්‍රමාණවත් ආදායමක් අත්කර දීම අවම මිල පැනවීමක අරමුණ වේ.
- ඒ අනුව අවම මිලක් ලෙස පනවන්නෙ සමතුලිත මිලට වඩා ඉහළ මිලකි.


- මෙසේ අවම මිලක් නියම කළ විට ඊට වඩා අඩු මිලකට භාණ්ඩයක් විකිණීම නීති විරෝධී වේ.

උදා - වී සඳහා අවම මිලක් නියම කිරීම

අවම වැටුප් සීමා නියම කිරීම




### අවම මිල නියම කිරීමක ආර්ථික ප්‍රතිවිපාක



**i. අධි සැපයුමක් බිහිවීම.**

සැපයුම් කරනු ලබන ප්‍රමාණය ඉල්ලුම් ප්‍රමාණයට වඩා වැඩි බැවින් වෙළඳපොළ තුල භාණ්ඩ අතිරික්තයක් (අධි සැපයුමක්) ඇතිවේ.

මෙහිදී අධි සැපයුම වේ

**ii. සේවාවක් සම්බන්ධයෙන් අවම මිල පැනවූ විට විශේෂ ගැටලු ඇති වීම.**

**නිද- ශ්‍රමය සඳහා අවම වැටුප් නියම කිරීමේදී ඇතිවන විරැකියාව**

**iii. සලාක කිරීමේ කාර්යය ඉටුකිරීමට මිල අපොහොසත් වීම.**

**iv. අවම මිල නාමික මිලක් ලෙස පමණක් භාවිතා කිරීම.**

නීතියෙන් පලා යාම සඳහා බොහෝ වෙළඳුන් අවම මිල නාමික මිලක් ලෙස පමණක් තබාගෙන වට්ටම් කළ මිල ගණන් යටතේ භාණ්ඩ සැපයීම.


නිද - ගුවන් ටිකට් පත්

**v. භාණ්ඩය නිෂ්පාදනය කිරීමට කරන ආයෝජන වැඩි කිරීම.**

අවම මිල නිසා (මිල වැඩි වීමෙන්) එම නිෂ්පාදන කර්මාන්ත වල කරනු ලබන ආයෝජන වැඩි වීම.

**vi. සුභසාධනය පහළ යාම**

- **අවම මිල ප්‍රතිපත්තිය ශුභසාධන ප්‍රතිවිපාකය**




අහිමිවනු සුභසාධනය -( E+F ) වේ

## සහතික මිල ප්‍රතිපත්තිය මිල ආධාරක ප්‍රතිපත්තිය

අවම මිල පැනවීමෙන් පසු අධි සැපයුමක් ඇති වීම නිසා එය දිගටම රඳවා ගැනීම අපහසු වේ.

සහතික මිල ප්‍රතිපත්තිය් යනු රජය විසින් පැනවූ අවම මිල නිෂ්පාදකයාට ලැබීම සහතික කිරීමට ගන්නා ක්‍රියාමාර්ගයයි.

මෙහිදී අවම මිල අසාර්ථක වීමට බලපාන අධි සැපයුමට විසඳුමක් ලබාදීම තුළින් ලබා දීම තුලින් අවම මිල සහතික මිලක් බවට පත් කෙරේ.

සහතික මිල ප්‍රතිපත්තිය අවම මිල ප්‍රතිපත්තියෙන් වෙනස් වන්නේ අධි සැපයුම කළමනාකරණය කිරීමට ගන්නා ක්‍රියාමාර්ග මතය.

අවම මිල ප්‍රතිපත්තියේ දී සිදුවන්නේ භාණ්ඩය සඳහා අවම මිලක් නීතියෙන් ප්‍රකාශ කිරීම පමණි. එහිදී අතිරික්ත සැපයුම සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියාමාර්ග පිළිබඳ සැලකිලිමත් නොවේ. මේ නිසා අවම මිල ප්‍රතිපත්ති අසාර්ථක විය හැක.


නමුත් සහතික මිල ප්‍රතිපත්තියේ දී අධි සැපයුම කළමනාකරණය කිරීමටද ක්‍රියාමාර්ග ගන්නා බැවින් අවම මිල ප්‍රතිපත්තිය වඩා සඵල එකක් වේ.

**<u>සහතික මිල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ හැකි ආකාර 02 කි.</u>**

- අතිරික්ත රජය විසින් ගැනීම
- ඌණ පූර්ණ ගෙවීමේ ක්‍රමය

### ❖ රජය විසින් අතිරික්ත සැපයුම මිලට ගැනීමේ ක්‍රියාමාර්ගය

අවම මිල පැනවීමත් සමඟ ඇතිවන අතිරික්තය (අධි සැපයුම) එම අවම මිල යටතේම රජය විසින් මිලට ගැනීම මෙහිදී සිදු වේ.



- මෙහිදී P2 ලෙස අම මිලක් පනවා තිරික්කලේ විසින් මිළට ගැනීමේ සහතික මිල ක්‍රමය ක්‍රියාත්මක කරයි.
- ඒ අනුව 0-Q1 දක්වා ප්‍රමාණය පාරිභෝගිකයා විසින් මිලට ගනී.
- 0-Q1 දක්වා ප්‍රමාණය (අතිරික්තය) P2 මිල යටතේ රජය විසින් මිලට ගනී.

රජයේ මෙම ප්‍රතිපත්තිය සාර්ථක එකක් වනුයේ මිලදී ගත් අතිරික්ත සැපයුම කළමනාකරණය කළ හොත් පමණි. ඒ සඳහා රජයට විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කළ හැක.

- අධි සැපයුම රජය විසින් මිලදී ගෙන ගබඩා කර භාණ්ඩ හිග කාල තුලදී භාණ්ඩ නිකුත් කිරීම

- අධි සැපයුම අපනයනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

- අතිරික්ත තොග විනාශ කිරීම

01. තරඟකාරී වෙළඳපොලක ඇති එක්තරා භාණ්ඩයක පහත තොරතුරු දැක්වේ.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 100 | 200 | 300 |
| 40 | 500 | 0 |

i. ඉල්ලුම් සැපයුම් වක්‍ර ප්‍රස්තාර සටහනක දක්වා සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

අ) පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදන අතිරික්තය, ආර්ථික අතිරික්තය කොපමනද?

………………………………………………………………………………………
………………………………………………………………………………………
………………………………………………………………………………………
………………………………………………………………………………………
………………………………………………………………………………………
………………………………………………………………………………………
………………………………………………………………………………………
………………………………………………………………………………………

- මෙම භාණ්ඩය සඳහා රු 100ක අවම මිලක් නියම කර අතිරික්ත සැපයුම රජය විසින් මිලදී ගනී නම් පහත ඒවාට පිළිතුරු සපයන්න

i. එහිදී ඇතිවන අතිරික්ත සැපයුම

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

ii. පාරිභෝගික ,නිෂ්පාදන ,ආර්ථික අතිරික්තය කොපමණද?

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

iii. රජයේ පිරිවැය හා සුභසාධන පිරිවැය කොපමණද ?

……………………………………………………………………………………………


……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

## ❖ ඌණ පූර්ණ ගෙවීමේ ක්‍රමය

වෙළඳපොළෙන් ලැබූ මිලත් සහතික මිලත් අතර වෙනස රජය විසින් නිෂ්පාදකයන්ට ගෙවීම මෙහිදී සිදුවෙයි. එහිදී නිෂ්පාදනය කරන සෑම ඒකකයකටම ඌණ පූර්ණ ගෙවීම් සිදු කරයි.




**මෙහිදී P2 ලෙස අවම මිලක් පනවා ඌන පූර්ණ ගෙවීමේ ක්‍රමය ක්‍රියාත්මක කරයි.**

එම මිල යටතේ සැපයුම් ප්‍රමාණය Q2 වේ. එම ප්‍රමාණයට වෙළඳපලෙන් ලැබෙන මිල (පාරිභෝගිකයා ගෙවන මිල) P3 වේ. P3-P2 අතර මිල ඌන පූර්ණ ගෙවීම රජය විසින් නිෂ්පාදකයන්ට Q2 ප්‍රමාණය දක්වා ගෙවනු ලබයි.

01. තරගකාරී වෙළඳපලක ඇති එක්තරා භාණ්ඩයක පහත තොරතුරු දැක්වේ

i. ඉල්ලුම් සැපයුම් වල ප්‍රස්තාර සටහනක දක්වා සමතුලිත මිල හා ප්‍රමාණය දක්වන්න.

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණයක |
|---|---|---|
| 100 | 200 | 300 |
| 40 | 500 | 0 |

ii. පාරිභෝගික ,නිෂ්පාදන ,ආර්ථික අතිරික්තය කොපමණද?

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

iii. මෙම භාණ්ඩය සඳහා රු. 120 ක අවම මිලක් නියම කර ඌණ පූර්ණ ගෙවීමේ ක්‍රමයක් නියම කර දුනි නම් පහත ප්‍රශ්න වලට පිළිතුරු සබයන්න.

(අ) එහිදී වෙළඳපොල මිල

……………………………………………………………………………………………
……………………………………………………………………………………………


(ආ) පාරිභෝගික ,නිෂ්පාදන ,ආර්ථික අතිරික්තය කොපමණද?

……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………

……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………

රජයේ පිරිවැය හා සුභසාධන පිරිවැය කොපමණද ?

……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………
……………………………………………………………………………………………



ආදරණීය දුවේ පුතේ මෙය උසස් පෙළට පෙනී සිටින ඔබ වෙනුවෙන් සකස් කරන ලද්දකි.

විෂය පෝෂණය සඳහා මීට අමතරව,
අතිරේක කියවීම්, කාලීන ආර්ථික සිදුවීම් හා සංඛ්‍යා ලේඛන
පිළිබඳව
යාවත්කාලීන දැනුම ඔබ විසින් ලබාගත යුතුය.
ඔබට ජය !

ජී.කේ. නිරෝෂා දීපානි
ශ්‍රී ලංකා ගුරු සේවය (ආර්ථික විද්‍යාව)
ර/බල මැද්දෙකන්ද මහා විද්‍යාලය
බලංගොඩ